| 11 ශ්‍රේණිය | පුරවැසි අධ්‍යාපනය - II | |
|---|---|---|

නම :- ........................................................ විභාග අංකය :- ................................

❖ පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.

❖ පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න. (පිළිතුරු ලිවිය යුතු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.)

1) 1. ප්‍රජාතන්ත්‍රවාදයේ ස්වරූප දෙක ලියන්න.
   2. ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ නිර්වචන ඉදිරිපත් කළ දෙදෙනෙකු නම් කරන්න.
   3. ඇතැන්ස් පෞර රාජ්‍යයේ ප්‍රධාන පාලන ආයතනය හඳුන්වන නම සහ ඇතැන්ස් පෞර රාජ්‍යයේ පාලන ක්‍රමය ද ලියන්න.
   4. බහු පක්ෂ ක්‍රමය පවතින රටවල් දෙකක් ලියන්න.
   5. ඡන්ද කොට්ඨාශ බෙදා වෙන්කිරීම සඳහා භාවිතා කරන නිර්ණායක දෙක ලියන්න.
   6. නිදහස් හා සාධාරණ මැතිවරණයක ලක්ෂණ දෙකක් ලියන්න.
   7. බෙරුම්කරණය සිදුවන ආකාරය අනුව එහි කොටස් දෙක නම් කරන්න.
   8. අග්‍ර විනිශ්චයකාරතුමාගේ කාර්යයන් දෙකක් ලියන්න.
   9. ශ්‍රී ලංකාවේ පවත්වන මැතිවරණ දෙකක් ලියන්න.
   10. ශ්‍රී ලංකාවේ පරිපාලන දිස්ත්‍රික්ක දෙකක් ලියන්න.

2) ශ්‍රී ලංකාවේ නීතිය ක්‍රියාත්මක කිරීම සඳහා විවිධ අධිකරණ ආයතන පිහිටුවා ඇත.
   1. ශ්‍රී ලංකාවේ අධිකරණ පද්ධතියේ ඉහළම අධිකරණ දෙක පිළිවෙලින් ලියන්න.
   2. ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන විශේෂ නීති වර්ග තුනක් සඳහන් කරන්න.
   3. දේශීය නීතියේ ප්‍රභේද තුන නම් කර, එකක් විස්තර කරන්න.

3) ශ්‍රී ලංකාවේ අධිකරණ කටයුතු හා නීතිය පිළිබඳ ක්‍රියාත්මක කිරීමට ප්‍රධාන නිලධාරීන් තිදෙනෙක් සිටිති.
   1. එම නිලධාරීන් දෙදෙනෙක් නම් කරන්න.
   2. ඉන් එක් අයෙකුගේ කාර්යභාරයන් තුනක් ලියන්න.
   3. ඔම්බුඩ්ස්මන්වරයාගේ කාර්යයන් දෙකක් නම් කර, එතුමා හඳුන්වන අනෙක් නම ද, ලියන්න.

4) ආර්ථිකයක සිදුවන ක්‍රියාවලි අතර නිෂ්පාදන ක්‍රියාවලිය වැදගත් වේ.
   1. නිෂ්පාදන සාධක දෙකක් නම් කරන්න.
   2. ආර්ථිකයක නිෂ්පාදන ක්‍රියාවලිය සිදුවන අංශ තුනක් නම් කරන්න.
   3. නිෂ්පාදනය කරන භාණ්ඩ පරිභෝජනය කරන ආකාරය අනුව බෙදිය හැකි කොටස් තුන නම් කර එකක් කෙටියෙන් විස්තර කරන්න.